---

**වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාව**

**පුත්තලම දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන, 2013 මාර්තු 01 දින ද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2012 පෙබරවාරි 24 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 සැප්තැම්බර් 30 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව, වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාවේ, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර, 2012 දෙසැම්බර් 31 දිනට වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

සභාවට අයත් බෙහෙත් ශාලා ගොඩනැඟිලි 02ක, ජල ටැංකි 03ක, වටිනාකම් ඇස්තමේන්තු කර ගිණුම්වලට ගෙන නොතිබූ අතර, බෙහෙත් ශාලාව ඉදිකරන ලද ඉඩමෙහි වටිනාකම රු.300,000ක් ද ගිණුම්වලින් අත්හැරී තිබුණි.

**1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.46,455,123ක් වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

**2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.3,016,636ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.1,784,446ක් විය.

**2.2 මූල්‍ය පාලනය**

පහත සඳහන් මූල්‍ය පාලන ඌනතා නිරීක්ෂණය විය.

**(අ)** 2012 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද ගිණුම්වලට අනුව ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.4,423,444ක් වූ අතර, එයින් අවුරුදු එකක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.519,426ක් විය.

**(ආ)** 2012 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු.731,572ක් වූ අතර, අවුරුදු 01ක් ඉක්මවා ඇති ශේෂවල වටිනාකම රු.258,712ක් විය.

(ඇ) 2010 මැයි 13 දිනැති අංක 5/3 දරණ මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කල් ඉකුත් වූ ආපසු ගෙවිය යුතු තැන්පතු රු.712,007ක් ආදායමට ගෙන නොතිබුණි.

**2.3 ආදායම් පරිපාලනය**

**2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්**

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට ආදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. 000' | රු. 000' | රු. 000' |
| (i) වරිපනම් හා බදු | 1,491 | 515 | 976 |
| (ii) බදු කුලී | 1,190 | 1,100 | 90 |
| (iii) බලපත්‍ර ගාස්තු | 228 | 228 | -- |
| (iv)වෙනත් ආදායම් | 7,337 | 4,904 | 2,433 |

**2.3.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 632,628 |
| (ii). | මුද්දර ගාස්තු | 1,800,000 |

**2.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත භෞතික සම්පත්**

වටිනාකම රු.500,000ක් වූ ජල පොම්ප 06ක් වසර 05ක් ද, වටිනාකම රු.70,000ක් වූ ලීටර් 2000 බවුසරය හා රු.40,000ක් වූ අඟල් 1 ½ විදුලි මෝටරය වසර 03ක් ද, රු.300,000ක් වූ 49-7272 ට්‍රැක්ටරය, රු.60,000ක් වූ අඟල් 4 විදුලි මෝටරය, වටිනාකම ඇස්තමේන්තු නොකළ කොම්පෝස්ට් බඳුන් 29ක් වසර 02ක් නිශ්කාර්යව පැවතුණි.

## 2.5 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ) 2012 දෙසැම්බර් 31 දිනට සභාවට අයත් පුස්තකාල 2ක් මඟින් පාඨකයින් වෙත ලබාදී තිබූ රු.67,684ක් වටිනා පුස්තකාල පොත් 449ක් ආපසු භාරදිය යුතු කාලය ඉකුත් වී ඇති නමුත්, එම පොත් ආපසු ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ආයතනය තුළ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ඇ) 1989 අප්‍රේල් 17 දිනැති අංක 554/5 දරණ ශ්‍රී ලංකා ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රය vi (ආ) කොටසෙහි 205 රීතිය ප්‍රකාරව සභාව සතු සියළු වත්කම් සමීක්ෂණය කර වාර්තා පිළියෙල කර නොතිබුණි.

(ඈ) 2011 දෙසැම්බර් 15 දිනැති අංක ව/ප්‍රලේ/5/4/1/8 දරණ චක්‍රලේඛය ප්‍රකාරව සේවක ඇප තැබිය යුතු කිසිදු සේවකයෙකුගෙන් ඇප මුදල් ලබාගෙන නොතිබුණි.

(ඉ) 2012 වර්ෂයේ දී කොන්ත්‍රාත් වැඩ 04ක් මඟින් වැඩ ආරම්භකරන ලද ඝණ අපද්‍රව්‍ය මධ්‍යස්ථානයේ ඉදිකිරීම්වලට අදාළ ගිවිසුම් කාලය අවසන්ව ඇති නමුත්, 2013 මැයි 30 විගණන අවස්ථාව වන විටත් ඒවායේ වැඩ නිම වී නොතිබුණි.

## 2.6 අභ්‍යන්තර විගණනය

ආයතනය තුල ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

## 3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය